# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 35 දරන
# දේශීය ආදායම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැක.

මිල : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 35 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 අගෝස්තු මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 92/92

1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1993 අංක 35 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1979 අංක 28 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ ඡේදයේ (Lxi) වන අනුඡේදයේ " රබර් පර්යේෂණ මණ්ඩලය ; සහ " යන වචන වෙනුවට " රබර් පර්යේෂණ මණ්ඩලය ; " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදයේ (Lxii) වන අනුඡේදයේ " බුද්ධ ශාසන අරමුදල " යන වචන වෙනුවට " බුද්ධ ශාසන අරමුදල ; " යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ ඡේදයේ (Lxii) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් :—

" (Lxiii) 1988 අංක 77 දරන ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනත මගින් පිහිටුවන ලද ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය ; සහ

(Lxiv) 1981 අංක 3 දරන ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය. ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ (ආ) ඡේදයේ " නිල පඩි නඩි " යන වචන වෙනුවට " 1993 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ නිල පඩි නඩි " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ආආ) 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා නිල පඩිනඩි, යම් විශ්‍රාම වැටුප් හෝ 4(1) වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් සේවා නියුක්තියකින් ලැබෙන යම් ලාභ වශයෙන්—

(i) ඒකාබද්ධ අරමුදලින් යම් පුද්ගලයකුට ගෙවීම් ;

(ii) ඒකාබද්ධ අරමුදලින් සංස්ථාවට වාර්ෂිකව පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන මුදල්වලින් එම පඩිනඩි හෝ එම විශ්‍රාම වැටුප හෝ එම ලාභ සම්පූර්ණ යෙන්ම හෝ ඉන් කොටසක් ගෙවන රාජ්‍ය සංස්ථාවක් වන යම් රාජ්‍ය සංස්ථා වක් විසින් යම් සේවා නියුක්තයකුට ගෙවීම් ;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ ව්‍යවස්ථාව යටතේ යම් පළාතක් සඳහා පත් කරන ලද ආණ්ඩුකාරවරයාට ගෙවීම් ;

(iv) යම් පළාත් සභාවක යම් මන්ත්‍රීවරයකුට ගෙවීම් ;

(v) යම් පළාත් සභාවක යම් සේවා නියුක්තය කුට හෝ යම් පළාත් රාජ්‍ය සේවයක යම් නිලධරයකුට ගෙවීම් ;

(vi) යම් පළාත් පාලන ආයතනයක යම් සභික යකුට ගෙවීම් ;

(vii) යම් පළාත් පාලන ආයතනයක යම් සේවා නියුක්තයකුට ගෙවීම් ;

(viii) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවනු ලද හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන යම් විශ්ව විද්‍යාල යක යම් සේවා නියුක්තයකුට ගෙවීම් ;

(ix) 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පනත මගින් පිහිටු වන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සේවා නියුක්තයකුට ගෙවීම් ;

(ආආ) 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් පුද්ගලයකුට (ආආ) ඡේදයේ (ii) වන අනු ඡේදයේ සඳහන් යම් රාජ්‍ය සංස්ථාවක් හැර, වෙනත් යම් රාජ්‍ය සංස්ථාවක සේවා නියුක්ති කයකු වශයෙන්, මේ පනත ආරම්භ වීමට පෙර හෝ පසුව හෝ ඒ පුද්ගලයා විසින් හෝ වෙනත් යම් පුද්ගලයකු විසින් ඉටු කරන ලද සේවා සම්බන්ධයෙන්, ලැබෙන යම් විශ්‍රාම වැටු පත් සහ 4(1) වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සේවා නියුක්තයන්ගෙන් ලැබෙන ලාභ ; ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ආ) ඡේදයේ " 16ආ වන, 16ඇ වන, 17 වන, 17අ වන," යන ඉලක්කම් සහ වචන වෙනුවට " 16ආ වන, 16ඇ වන, 16ඈ වන, 17 වන, 17අ වන " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.**

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදයේ (xxi) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (xxii) යම් තැනැත්තකු විසින් දරනු ලබන යම් භාණ්ඩාගාර බිල්පත්‍රයක් ඒ තැනැත්තා විසින් ද්විතියික වෙළෙඳ පොළේ විකිණීමෙන් ; ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇඇඇ වගන්තිය සංශෝධනය කිරීම.**

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 ඇඇඇ වගන්තියේ (2) වන උපවගන්තියෙහි " 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීමකින් " යන වචන සහ ඉලක්කම් වෙනුවට " 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමකින් " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.**

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉඉඉ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ " 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් " යන වචන හා ඉලක්කම් වෙනුවට " 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර, යම් තැනැත්තකු විසින් " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (iiඅ) 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් අත්කර ගන්නා ලද යම් මෝටර් වාහනයක්, ලොරියක්, බස් රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් හෝ කාර්යාල ගෘහ භාණ්ඩ ඔහු විසින් කර ගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ඒවා පාවිච්චි කිරීමේ දී ගෙවියාමෙන් උද්ගතවන ක්ෂයවීම සඳහා එය අත්කර ගැනීමේ පිරිවැය මත වර්ෂයකට සියයට දහසයයි තුනෙන් දෙකක අනුප්‍රමාණය අනුව ; " ;

(3) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර, යම් තැනැත්තකු විසින් යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(4) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(iiiඅ) යම් තැනැත්තකු විසින් ඉදිකරනු ලැබුවා වූ ද ඉදිකිරීම 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු සම්පූර්ණ කරනු ලැබුවා වූ ද යම් සුදුසුකම් ලත් ගොඩනැගිල්ලක් ඔහු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ප්‍රයෝජනයට ගැනීමේ දී ගෙවීයාමෙන් උද්ගතවන ක්ෂය වීම සඳහා එය ඉදිකිරීමේ පිරිවැය මත වර්ෂයකට සියයට හයයි තුනෙන් දෙකක අනුප්‍රමාණය අනුව ;";

(5) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එම තැනැත්තා විසින්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර එම තැනැත්තා විසින්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(6) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ivඅ) 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එම තැනැත්තා විසින් අත්කර ගන්නා ලද, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය දේපළක් සංයුක්ත වන්නා වූ නිර්නේවාසික ඉඩකඩ ඒකකයක් ඔහු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ප්‍රයෝජනයට ගැනීමේ දී ගෙවීයාමෙන් උද්ගතවන ක්ෂයවීම සඳහා එය අත්කර ගැනීමේ වටිනාකම මත වර්ෂයකට සියයට හයයි තුනෙන් දෙකක අනුප්‍රමාණය අනුව දීමනාවක් ; "

(7) ඒ ඡේදයේ අනුරු විධානයේ "මේ ඡේදයේ (i) වන අනුඡේදයේ හෝ (ii) වන අනුඡේදයෙහි හෝ (iii) වන අනුඡේදයෙහි හෝ (iv) වන අනුඡේදයෙහි සඳහන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "මේ ඡේදයේ (i) වන අනුඡේදයෙහි හෝ (ii) වන අනුඡේදයෙහි හෝ (iiඅ) වන අනුඡේදයෙහි හෝ (iii) වන අනුඡේදයෙහි හෝ (iiiඅ) වන අනුඡේදයෙහි හෝ (iv) වන අනුඡේදයෙහි හෝ (ivඅ) වන අනුඡේදයෙහි සඳහන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇ) 1966 අංක 10 දරන සංචාරක මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත කළා වූ ද ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ද වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පමණක් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම් හැර, සංචාරකයන් සඳහා යම් හෝටලයක් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේදී, 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව දරන ලද යම් වියදමක් ;";

(2) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "සම්බන්ධයෙන් ඔහුගේ ප්‍රචාරක වියදම්න්" යන වචන වෙනුවට "සම්බන්ධයෙන් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර දරන ලද ඔහුගේ ප්‍රචාරක වියදම්න්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ට) ඡේදයේ "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු එහෙත් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ උපවගන්තියේ (ට) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ටට) 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඔහු විසින් ඇතුළත් වූ යම් ගිවිසුමක් යටතේ වූ යම් වර්ෂයක දී ගෙවන ලද බදු කුලියේ කොටස—

(i) ඒ ගිවිසුම (ii) වන ඡේදයේ සඳහන් පිරියතක්, යන්ත්‍රයක්, සවිකිරීමක් හෝ උපකරණයක් නොවන යම් පිරියතක්, යන්ත්‍රයක් සවිකිරීමක් හෝ උපකරණයක් සම්බන්ධයෙන් වන විට, ඒ ගිවිසුම යටතේ ගෙවිය යුතු සම්පූර්ණ බදු කුලියෙන් තුනෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් ඉක්මවන ප්‍රමාණය ; සහ

(ii) ඒ ගිවිසුම යම් මෝටර් වාහනයක්, ලොරියක්, බස් රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් සහ කාර්යාල ගෘහභාණ්ඩ සම්බන්ධයෙන් වන විට, ඒ ගිවිසුම යටතේ ගෙවිය යුතු සම්පූර්ණ බදු කුලියෙන් හයෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් ඉක්මවන ප්‍රමාණය ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ " (ට) ඡේදයේ සඳහන් අනුමත ව්‍යවසායක් නොවන, අනුමත ව්‍යවසායක " යන වචන වෙනුවට, " (ට) ඡේදයෙහි සඳහන් අනුමත ව්‍යවසායක් නොවන, අනුමත ව්‍යවසායක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ " සඳහන් අනුප්‍රමාණ අනුව " යන වචන වෙනුවට " සඳහන් උචිත අනුප්‍රමාණය අනුව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 32ඇඇ වගන්තිය ඇතුළත් කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඇ වගන්තියට ඉක්බිතිව ම, පහත දක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 32ඇඇ වගන්තිය වශයෙන් බලසහිත විය යුතු ය:—

" ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමකට හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට ගෙවිය යුතු රාජ්‍ය භාගය මත ආදායම් බදු අනුප්‍රමාණය.

32ඇඇ. ශ්‍රී ලංකාවෙන් පිටත යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට ශ්‍රී ලංකාවේ උද්ගතවන හෝ ශ්‍රී ලංකාවේ උද්ගත වන්නේ යයි 80ආ වගන්තිය යටතේ සළකනු ලබන රාජ්‍ය භාගය වශයෙන් ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් ඒ සමාගමට, හවුල් ව්‍යාපාරයට හෝ පුද්ගල මණ්ඩලයට, 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු දළ රාජ්‍ය භාගය මත මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇතද, සියයට පහළොවක අනුප්‍රමාණයක් අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ ඡේදයේ (vi) වන අනුඡේදයේ " 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා " යන ඉලක්කම් සහ වචන වෙනුවට " 1992 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; ";

(2) ඒ ඡේදයේ (vi) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

" (vii) 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ යුතු ආදායම රුපියල් දෙලක්ෂ හැත්තෑ හත් දහස් හත්සිය හැත්තෑ අටක් නොඉක්ම වන්නා වූ ; ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 33ඈ වගන්තිය සංශෝධනය කිරීම.**

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33ඈ වගන්තියේ (i) වන ඡේදයේ (ඇ) අනුඡේදයේ (II) වන විෂයාංකයට ඉක්බිතිව ම පහත දැක්වෙන විෂයාංකය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(iiඅ) අන්තිකාරම් සමාගම් බද්ද සියයට 40 බැගින් ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද එම ලාභාංශ ;".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iiඅ) අන්තිකාරම් සමාගම් බද්ද සියයට 40 බැගින් ගෙවනු ලැබ ඇත්තේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද, ලැබුණු ඒ ලාභාංශවලින්";

(2) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ, "(ඇ) ඡේදයේ (ii) වන, හෝ (iii) වන හෝ (iv) වන අනුඡේදයේ සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(ඇ) ඡේදයේ, (ii) වන, හෝ (iiඅ) වන, හෝ (iii) වන හෝ (iv) වන අනුඡේදයේ සඳහන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වගන්තිය සංශෝධනය කිරීම.**

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, "ඔහුට හිමිකම ඇත්තේ ය." යන වචන වෙනුවට "ඔහුට හිමිකම ඇත්තේ ය. එසේ වුවද ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය එකී වෙනත් රටේදී එම ලාභ හා ආදායම සම්බන්ධයෙන් එකී අනුරූප කාලසීමාව සඳහා ආදායම් බදු ගෙවීමට යටත් නොවන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දී ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බදු ගණනට සමාන සහනයකට ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය හිමිකම් ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) (i) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි—

(අ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ (ආ) විෂයාංකයේ "ලියාපදිංචි වූ යම් හවුල් ව්‍යාපාරයකට ;" යන වචන වෙනුවට "ලියාපදිංචි වූ යම් හවුල් ව්‍යාපාරයකට ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (iii) (ii) වන අනුඡේදයේ සඳහන් යම් නිර්වාසික තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට වාස්තු විද්‍යාත්මක, ඉංජිනේරු, පරිමාණ සමීක්ෂණ හෝ ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සහ ඊට ආනුෂංගික වෙනත් සේවා ශ්‍රී ලංකාවේ දී සලසන්නා වූ යම් නිර් වාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි වූ හවුල් ව්‍යාපාරයකට.";

(ii) ඒ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ " (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් " යන වචන හා ඉලක්කම් වෙනුවට " (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ හෝ (iii) වන අනුඡේදයේ සඳහන් " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තියේ (1) වන උපවගන්තියේ උපලේඛනය වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" උපලේඛනය

| I වන තීරය | II වන තීරය |
|---|---|
| භාණ්ඩාගාර බිල් පත්‍රය | බද්ද අනුප්‍රමාණය |
| භාණ්ඩාගාර බිල් පත්‍රය නිකුත් කිරීමේ දිනයට පසුව මාස දොළහකින් පරිණතවන යම් භාණ්ඩාගාර බිල් පත්‍රයක්. | එම භාණ්ඩාගාර බිල් පත්‍රයේ මතුපිට වටිනාකමින් සියයට 2 ක්. |
| භාණ්ඩාගාර බිල් පත්‍රය නිකුත් කිරීමේ දිනයට පසුව මාස හයකින් පරිණත වන යම් භාණ්ඩාගාර බිල් පත්‍රයක්. | එම භාණ්ඩාගාර බිල් පත්‍රයේ මතුපිට වටිනාකමින් සියයට 1 ක්. |
| භාණ්ඩාගාර බිල් පත්‍රය නිකුත් කිරීමේ දිනයට පසුව මාස තුනකින් පරිණත වන යම් භාණ්ඩාගාර බිල් පත්‍රයක්. | එම භාණ්ඩාගාර බිල් පත්‍රයේ මතුපිට වටිනාකමින් 0.5 ක්.". |

ප්‍රධාන ප්‍රඥප්තියේ XVඅ අළුත් පරිච්ඡේදයක් ඇතුළත් කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ XVආ පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ XVඇ පරිච්ඡේදය වශයෙන් බලසහිත විය යුතු ය :—

"XVඇ පරිච්ඡේදය

නිශ්චිත සේවායෝජකයන් විසින් සේවා නියුක්තයන්ගේ බද්ද ගෙවීම පිළිබඳ විශේෂ විධිවිධාන :—

"සේවා නියුක්තයන්ගේ ආදායම් බද්ද නිශ්චිත සේවායෝජකයන් විසින් ගෙවිය යුතු බව.

113ක. (1) 2 වන වගන්තියේ සහ XIV වන සහ XV වන පරිච්ඡේදවල කුමක් සඳහන්ව ඇත ද 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් නිශ්චිත සේවායෝජකයකුගේ යම් සේවා නියුක්තයකුගේ

නිල පඩිනඩිවලට ආරෝපණය කළ හැකි ආදායම් බද්ද, ඒ සේවායෝජකයා විසින් ගෙවිය යුතු වෙනත් ආදායම් බද්දකට අතිරේකව, ඒ සේවා යෝජකයා විසින් ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් නිශ්චිත සේවායෝජකයකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද මාසික වාරිකවලින් ගෙවිය යුතු අතර ඒ අනුව 98 වන වගන්තියේ, 99 වන වගන්තියේ, 102 වන වගන්තියේ, 105 වන වගන්තියේ, 106 වන වගන්තියේ, 107 වන වගන්තියේ, 110 වන වගන්තියේ සහ 112 වන වගන්තියේ විධිවිධාන ඒ සේවායෝජකයා විසින් ගෙවිය යුතු ආදායම් බද්දට අදාළ විය යුතු ය. එසේ වුවද එම විධිවිධාන, ඒවායේ යෙදෙන 'අඩුකිරීම' යන වචනය වෙනුවට 'ගෙවීම' යන වචනය ද 'පාරිශ්‍රමික', යන වචනය වෙනුවට 'නිල පඩිනඩි' යන වචන ද ආදේශ කිරීමේ වෙනසට යටත් විය යුතු ය.

**මූල ව්‍යවස්ථාපිත ආදායමට බදු ගෙවනු ලැබූ සේවා නියුක්ති ආදායම ඇතුළත් නොවිය යුතු බව.**

113ග. 27 වන වගන්තියෙහි කුමක් සඳහන්ව ඇතද යම් නිශ්චිත සේවායෝජකයකුගේ සේවා නියුක්තයකුගේ 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ මූළු ව්‍යවස්ථාපිත ආදායම, සේවා යෝජකයා විසින් 113 ක වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඒ සේවායෝජකයා විසින් ආදායම් බදු ගෙවිය යුතු වන්නේ යම් සේවානියුක්තියක් සම්බන්ධයෙන් ද එම සේවා නියුක්තිය හැර, එම තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ සෑම ලාභ සහ ආදායම් ප්‍රභවයකින්ම ලැබෙන ඔහුගේ ඒ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමේ එකතුව විය යුතු ය.

**31(2) (එ) වන වගන්තියේ සඳහන් සුදුසුකම් ලබන ගෙවීම සඳහා යම් නිශ්චිත සේවායෝජකයකුගේ සේවා නියුක්තයකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීමක් නොකළ යුතු බව.**

113ඝ. මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් නිශ්චිත සේවායෝජකයකුගේ යම් සේවානියුක්තයකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන්, 31 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (එ) වන ඡේදයේ සඳහන් වූද එම සේවා නියුක්තයා විසින් එම තක්සේරු වර්ෂය තුළ දී ගෙවනු ලැබුවාවූ ද, යම් සුදුසුකම් ලබන ගෙවීමක් සම්බන්ධයෙන්, 30(2) වන වගන්තියේ කාර්යය සඳහා කිසිම අඩුකිරීමක් නොකළ යුතු ය.".

**නිශ්චිත සේවා යෝජකයකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද අඩු කිරීමක් වශයෙන් ඉඩ දිය යුතු බව.**

113ජ. මේ පනතේ වෙනත් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද 113 ක වගන්තිය අනුව යම් නිශ්චිත සේවා යෝජකයකු විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද, ඒ සේවායෝජකයා විසින් කරගෙන යනු ලබන යම්

වෙළඳාමක හෝ ව්‍යාපාරයක ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී අඩු කිරීමක් වශයෙන් අඩුකිරීමට ඉඩදිය යුතු ය.

ආදායම් බද්ද ගණනය කිරීම.

113ට. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා යම් නිශ්චිත සේවායෝජකයකුගේ යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් නිල පඩිනඩිවලට ආරෝපණය කළ හැකි ආදායම් බද්ද—

(i) එම සේවානියුක්තයාගේ එම පඩිනඩි වලින් රුපියල් හතළිස් දෙදහසක් අඩු කළ පසුව එම පඩිනඩි මත මේ පනතේ උපලේඛනයේ iiඉ කොටසේ සඳහන් අනුප්‍රමාණ අනුව ගණනය කරන ලද ආදායම් බද්ද,

(ii) රුපියල් එක් දහස් අටසියය ඉක්මවන අතිරික්ත මුදල විය යුතු ය.

නිශ්චිත සේවායෝජක විසින් ගෙවන ලද ආදායම් බද්ද සේවානියුක්තියෙන් ලැබෙන ආදායම් කොටසක් නොවිය යුතු බව.

113ඩ. 4 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, යම් නිශ්චිත සේවායෝජකයකුගේ යම් සේවා නියුක්තයකුගේ නිල පඩිනඩි සම්බන්ධයෙන්, වූ ද ඒ සේවායෝජකයා විසින් ගෙවනු ලැබුවා වූ ද, ආදායම් බද්ද එම සේවානියුක්තයාගේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභයේ කොටසක් නොවන බව සැලකිය යුතු ය.

මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා—

"සේවකයා" යන්න යම් නිශ්චිත සේවායෝජක යකු සම්බන්ධයෙන් යෙදුන විට එම නිශ්චිත සේවායෝජකයාගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ඊට ඇතුළත් වේ ;

"නිශ්චිත සේවායෝජකයා" යන්නෙන්, 9(1) (ආආ) වගන්තියේ සඳහන් රාජ්‍ය සංස්ථාවක් නොවන රාජ්‍ය සංස්ථාවක් අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ III වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"III වන කොටස

ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිර්වාසිකයකු ලෙස සලකනු ලබන්නා වූ ද යම් පුද්ගලයකුට අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණ—

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 25 යි

1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 15 යි.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ I වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"I වන කොටස

II වන කොටසෙහි හෝ III වන කොටසෙහි හෝ IV වන කොටසෙහි හෝ IVඅ කොටසෙහි හෝ IVආ කොටසෙහි හෝ V වන කොටසෙහි හෝ Vඅ වන කොටසෙහි හෝ Vආ වන කොටසෙහි හෝ VI වන කොටසෙහි හෝ VIII වන කොටසෙහි සඳහන් සමාගමක් නොවන ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් හෝ (ශ්‍රී ලංකා බැංකුව හැර) IX වන කොටසෙහි සඳහන් රාජ්‍ය සංස්ථාවක්, හෝ X වන කොටසෙහි සඳහන් ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක්.

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය—

සමාගමේ බදු අය කළ හැකි ආදායම මත...සියයට 50

1992 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අනුප්‍රමාණය

සමාගමේ බදු අය කළ හැකි ආදායම මත...සියයට 45 ; "

(2) උපලේඛනයේ IV ආ කොටසෙහි "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අනුප්‍රමාණය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; "

(3) ඒ උපවගන්තියේ IVආ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්—

"IV ඇ කොටස

කුඩා සමාගම්

1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් අනු ප්‍රමාණ—

(1) සමාගමේ බදු අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහස නොඉක්මවන්නේ නම්.........

සමාගමේ බදු අය කළ හැකි ආදායම මත සියයට 33 1/3

(2) සමාගමේ බදු අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහස ඉක්මවන්නේ නම් එහෙත් රුපියල් දෙලක්ෂ හැත්තෑ හත් දහස් හත් සිය හැත්තෑ අට නොඉක්මවන්නේ නම්—

(i) රුපියල් දෙලක්ෂ පනස් දහසින් සියයට 33 1/3 කට සමාන මුදලක් ; සහ

(ii) සමාගමේ බදු අයකළ හැකි ආදායම රුපියල් දෙලක්ෂ පනස් දහස ඉක්මවන්නා වූ මුදලේ

එකතුය බද්ද විය යුතුය ;

(4) ඒ උපලේඛනයේ Vආ කොටසෙහි—

"1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට අදාළ නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන්නා වූ ද ඒ තක්සේරු වර්ෂයේ අවසාන දිනයේ දී—" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයකට අදාළ නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන්නා වූ 1993 මාර්තු මස 31 වන දිනයේ දී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(5) ඒ උපලේඛනයේ VI වන කොටසෙහි "1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "1970 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(6) ඒ උපලේඛනයෙහි VII වන කොටසෙහි, "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(7) ඒ උපලේඛනයෙහි IX වන කොටසෙහි, "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(8) ඒ උපලේඛනයෙහි, X වන කොටසෙහි "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;" සහ

(9) ඒ උපලේඛනයෙහි X වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"XI වන කොටස

ඒකක භාරයක්, අන්‍යෝන්‍ය අරමුදලක් සහ (ශ්‍රී ලංකා මහ බැංකුව හැර) රාජ්‍ය සංස්ථාවක් ඇතුළත් වූ ද, එහෙත් IVඈ කොටසෙහි සඳහන් කුඩා සමාගමක් ඇතුළත් නොවන්නා වූ ද සමාගමක්—

1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම ආදායම් බදු අනුප්‍රමාණය—

සමාගමේ බදු අය කළ හැකි ආදායම මත සියයට 40.".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම්වල සිට එම ඡේදයේ අවසානය දක්වා ඇති වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:—

"1992 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා—

බදු අය කළ හැකි ආදායමේ පළමු රු. 25,000 මත සියයට 30

බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 25,000 මත සියයට 40

බදු අය කළ හැකි ආදායමේ ශේෂය මත සියයට 45

1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

බදු අය කළ හැකි ආදායමේ පළමු රු. 25,000 මත සියයට 30

බදු අය කළ හැකි ආදායමේ ඉතිරි ශේෂය මත සියයට 40.";

(2) ඒ උපලේඛනයේ II වන ඡේදයේ—

(1) එම ඡේදයේ (ඇ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඇ) 1992 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා—

(i) බදු අය කළ හැකි ආදායම මත සියයට 45

(ii) (i) වන ඡේදය යටතේ ගෙවිය යුතු බද්ද එයින් අඩු කිරීමෙන් පසුව ලාභ වල ශේෂය මත සියයට 25.";

(ii) ඒ ඡේදයේ (ඇ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඈ) 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

(i) බදු අය කළ හැකි ආදායම මත

සියයට 40

(ii) (i) වන විෂයාංකය යටතේ ගෙවිය යුතු බද්ද එයින් අඩු කිරීමෙන් පසුව ලාභ වල ශේෂය මත සියයට 25.".

ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය ප්‍රතිස්ථාපනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:—

"හත්වන උපලේඛනය

(33අ (1) වන වගන්තිය)

1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 25

(ii) නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල මත

සියයට 33 1/3

(iii) ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් විසින් හෝ කුඩා සමාගමක හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 50

1992 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය:—

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 25

(ii) නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 33 1/3

(iii) ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් විසින් හෝ කුඩා සමාගමක් හෝ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල මත

සියයට 40.

1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය :—

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත

සියයට 25

(ii) ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් විසින් හෝ කුඩා සමාගමක් නොවන සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදාහැරීමක මුදලට සමාන මුදල මත

සියයට 33 1/3 "

22. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඈඈ වගන්තියේ සඳහන් යම් සමාගමක් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ද ඒ අනුමැතිය පිළිබඳ දැන්වීම මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් එක් මාසයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ සමාගම 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

(2) මේ පනතේ 16 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තියට කරන ලද සංශෝධනය, 1993 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

23. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7 රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර ආගය මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.